වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
-------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 20 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 20 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2014 නොවැම්බර් 30 දින සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදි.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳවා අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ ඌණතා.

(i.) ගිණුම් ප්‍රකාශවල නිරීක්ෂණය වූ ඌනතා ආදායම් සහ බැරකම් වශයෙන් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | ආදායම් | | බැරකම් | |
|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. |
| වැඩියෙන් දැක්වීම් | - | - | 02 | 357,131 |
| අඩුවෙන් දැක්වීම් | 02 | 26,455,427 | - | - |

(ii) ලබාගත් වාහන 7 ක වටිනාකම තක්සේරු කර නොතිබුණි. එම නිසා ගිණුම් වල වත්කම් වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම

---------------------------------------

විගණනයට තොරතුරු ලබා නොදීම

--------------------------------------

විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිකම නිසා වටිනාකම රු.25,143,608 ක් වූ ගණුදෙනු දෙකක් විගණනයේදි සත්නිරික්ෂණය කළ නොහැකි විය.

1.3.3 අනුකූල නොවීම්

-------------------

පහත සඳහන් නීති,රීති, රෙගුලාසි සහ කළමනාකාරිත්ව තීරණ වලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදි නිරික්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන) රිති. | | |
| පරිච්ඡේදය V වගන්තිය 158(1) | - | රු.1,931,676 ක් වූ වරිපනම් බදු ගෙවීම පැහැර හැරි පුද්ගලයින්ට එරෙහිව ලේකම් විසින් වරෙන්තු නිකුත් කර නොතිබුණි. |
| 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | | |
| පරිච්ඡේදය V<br>වගන්තිය 132 | - | රුපියල් 1,000 ඉක්මවන විනෝද කටයුතු වියදම් සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය අවශ්‍ය වේ. එනමුත් එම අවශ්‍යතාවයට පටහැනිව සභා අරමුදලෙන් රු.26,501 ක් ගෙවා තිබුණි. |
| මුදල් රෙගුලාසි - 234 | - | හයමසක් ඉක්ම වූ රු.3,710 ක් සඳහා වූ මුදල් චෙක්පත් පිළිබඳව රෙගුලාසිය පරිදි කටයුතු කිරිමෙන් තොරව තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. |
| මුදල් රෙගුලාසි 571 | - | වසර දෙක ඉක්ම වූ රු. 268,129 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. |

2. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

--------------------------------------

2.1 මුල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශ වලට අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.215,932 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.27,675 ක් විය.

2.2 මූල්‍ය පාලනය

අයවැය විධිමත්ව පිළියෙල නොකර තිබූ නිසා අයවැයගත ආදායම සහ තත්‍ය ආදායම අතර රු.19,260,271 ක වෙනසක් ද අයවැයගත වියදම සහ තත්‍ය වියදම අතර රු.8,958,962 ක වෙනසක් ද විගණනයේදී නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපති විසින් ඉදිරිපත් කරන ලද පරිදි ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම් |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 644 | 123 | 1,932 |
| (ii) බදු කුලී | 10,950 | 11,836 | - |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,055 | 1,792 | - |
| (iv) වෙනත් ආදායම් | 42,941 | 62,099 | 52,654 |

2.3.2 ආදායම් කළමනාකරණය

(i.) රු.2,210,428 ක් වූ ණයගැති හිඟ මුදල් අයකර ගැනිම සඳහා නෛතික හෝ වෙනත් ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii.) ලැබිය යුතු බලපත්‍ර ගාස්තු ලේඛණයක සටහන් කර නොතිබූ අතර ඒ ඒ අවස්ථා වල මුදල් ලැබෙන විට සටහන් තබා තිබුණි. ඒ අනුව වර්ෂය සඳහා එකතු කළයුතු ගාස්තු නිවැරදිව ලබාගත නොහැකි විය.

2.3.3 උසාවි දඩ මුදල්

පේදුරුතුඩුව මහේස්ත්‍රාත් විසින් නොයෙකුත් ආඥා පනත් යටතේ වර්ෂ 2011 සිට 2013 දක්වා කාලය තුල අයකළ උසාවි දඩ මුදල් වෙනුවෙන් රු. 8,602,327 ක මුදලක් ආදායම් සහ ලැබියු යුතු මුදල් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. මෙම වාර්තාවේ දින දක්වා අයකළ මුදල රු.2,426,125 ක් විය.

2.3.4 මුද්දර ගාස්තු

-----------------

2010, 2011, 2012 සහ 2013 වර්ෂ සඳහා රු.88,623,794 ක මුදලක් මුද්දර ගාස්තු වශයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් ලැබිය යුතුව තිබුණි. මෙය ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබු නමුත් එම මුදල් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

--------------------------------

2.4.1 කාර්ය මණ්ඩල ණය අයකර නොගැනීම.

-----------------------------------------------

2012 වර්ෂයේ වැඩ තහනමට ලක්වු නිලධාරියෙකුගෙන් ලැබිය යුතු රු.20,500 ක් වු ආපදා ණය මුදල සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් අයකර ගෙන නොතිබුණි.

2.4.2 අක්‍රිය වත්කම්

------------------

(i.) සභාවට අයත් හානි වු වාහන 4 ක් සහා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(ii.) සීසැම් යන්ත්‍රයේ (සම්මත ) සැතපුම් මාපකය හානියට පත්වි තිබුණි. එම නිසා සමාලෝචික වර්ෂය තුලදි ඩීසල් සඳහා වැයකළ රු.45,339 ක මුදල පිළිබඳවා විගණනයේදි පරික්ෂා කළ නොහැකි විය.

2.4.3 වර්ෂික සමික්ෂණ මණ්ඩල වාර්තා මගින් හෙලි වු ඌනතා.

-------------------------------------------------------------------

2013 වර්ෂයේ වාර්ෂික සමික්ෂණ මණ්ඩල වාර්තාව තොග ලේඛණය සමග සැසඳීමේදි අයිතම 8 ක අතිරික්තයක් සහ අයිතම 5 ක ඌනතාවයක් හෙළි විය.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------

2.5.1 ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති

-----------------------------------

සභාව තම අයවැය මගින් සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති 6 ක් අනුමත කර තිබුණි. ප්‍රාග්ධන වැඩ සඳහා සභාව විසින් රු.මිලියන 8 ක් වෙන්කර තිබුණත් වැඩ වර්ගිකරණය කර නොතිබුණි.

2.5.2 අනුමැතියකින් තොරව සිදුකළ වැඩ

-----------------------------------------

සභා අරමුදලින් රු.845,258 ක් වැය කරමින් නෙල්ලිඅඩි ප්‍රසිද්ධ වෙළඳපොල සහ ප්‍රධාන කාර්යාලය ඉදි කිරිමේ වැඩ සභාව විසින් සිදුකර තිබුණි. මෙම වැඩ සඳහා සභා අයවැය තුලින් අනුමැතිය ලබා නොතිබුණි.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

2007-2009 කාල පරිච්ඡේදය තුලදි ප්‍රජා මධ්‍යස්ථාන දියුණු කිරිම සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් රු.10,300 ක් ලබා දි තිබුණි. මෙම වාර්තාවේ දින දක්වාත් එම මුදල් භාවිතා කර නොතිබුණි.

2.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

රැස් කරන ලද කසල ගිනි තබා විනාශ කර තිබුණි. කොම්පෝස්ට් නිෂ්පාදනයට හෝ කසල ප්‍රතිචක්‍රීකරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

(අ) අයවැය
(ආ) ආදායම් එකතු කිරීම
(ඇ) වාහන උපයෝජනය